## බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ජනාධිපති මාධ්‍ය සම්මාන - 2024

### *අයදුම්පත් කැඳවීම*

විශිෂ්ට මාධ්‍ය සංස්කෘතියක් රට තුළ ස්ථාපිත කිරීම උදෙසා මාධ්‍යවේදීන් සිදු කරන මෙහෙවර සහ ගුණාත්මක දායකත්වය ඇගයීම සඳහා ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ දෙවන වරටත් පැවැත්වීමට මෙම අමාත්‍යාංශය තීරණය කර ඇත.

ඒ සඳහා 2023 වර්ෂයෙහි මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් අඩවි මඟින් පළවූ/ විකාශය වූ ස්වකීය නිර්මාණ හා මාධ්‍ය පර්යේෂණ කෘතීන් ඉදිරිපත් කරන ලෙස සියලුම මාධ්‍යවේදීන්ට/ මාධ්‍ය ආයතන ප්‍රධානීන්ට මෙමඟින් ඇරයුම් කෙරේ.

### සම්මාන පිරිනමන ක්ෂේත්‍ර

| 01. | පුවත්පත් ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 1.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | 1.2 | වසරේ ප්‍රශස්ත ඡායාරූපය |
| | 1.3 | වසරේ ප්‍රශස්ත තීරු ලිපිය |
| | 1.4 | වසරේ ප්‍රශස්ත කාටූන් නිර්මාණය |
| | 1.5 | වසරේ ප්‍රශස්ත පිටු සැලසුම |
| | 1.6 | වසරේ ප්‍රශස්ත විශේෂාංග ලිපිය |
| | 1.7 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක පුවත |

| 02. | ගුවන්විදුලි ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 2.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | 2.2 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම |
| | 2.3 | වසරේ ප්‍රශස්ත ගුවන්විදුලි වැඩසටහන |
| | 2.4 | වසරේ ප්‍රශස්ත ළමා වැඩසටහන |
| | 2.5 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන |
| | 2.6 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන |

| 03. | රූපවාහිනී ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 3.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | 3.2 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම |
| | 3.3 | වසරේ ප්‍රශස්ත වැඩසටහන ඉදිරිපත් කිරීම |
| | 3.4 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන |
| | 3.5 | වසරේ ප්‍රශස්ත වාර්තා වැඩසටහන |
| | 3.6 | වසරේ ප්‍රශස්ත සංවාදාත්මක වැඩසටහන |
| | 3.7 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන |

| 04. | වෙබ් අඩවි ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 4.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වෙබ් අඩවිය |
| | 4.2 | වසරේ ප්‍රශස්ත වෙබ් වාර්තාකරණය |
| | 4.3 | වසරේ ප්‍රශස්ත බහුමාධ්‍ය භාවිතය |
| | 4.4 | වසරේ ප්‍රශස්ත බ්ලොග් (Blog) රචක |

| 05. | මාධ්‍ය පර්යේෂණ ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 5.1 | වසරේ ප්‍රශස්ත මාධ්‍ය පර්යේෂණ ශාස්ත්‍රීය කෘතිය |

| 06. | පාසල් මාධ්‍ය ක්ෂේත්‍රය | |
|---|---|---|
| තරග අංශ | 6.1 | වසරේ ප්‍රශස්ත පාසල් මාධ්‍ය ඒකකය/ සමාජය /සංගමය /කවය |

## නිර්මාණ ඉදිරිපත් කළ යුතු ආකාරය

ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ ජාතික මට්ටමේ ජනමාධ්‍යවේදීන්ගේ නිර්මාණ ඇගයීම උදෙසා පවත්වනු ලබන බැවින් ඒ සඳහා සුදුසු වන නිර්මාණ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පහත කොන්දේසිවලට යටත්ව ඉදිරිපත් කළ හැකිය.

## කොන්දේසි :

01. මෙම සම්මාන උදෙසා 2023.01.01 දින සිට 2023.12.31 දක්වා පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනී හා වෙබ් අඩවි මඟින් පළමුවෙනි වරට පළ කරන ලද/ විකාශය කරන ලද නිර්මාණ සලකා බලනු ලැබේ. නැවත විකාශය කරනු ලැබූ නිර්මාණ තරගයට භාර ගනු නොලැබේ.

02. සම්මාන සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේ මෙම අමාත්‍යාංශයේ බලපත්‍රලාභී රූපවාහිනී/ ගුවන්විදුලි ආයතනයක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පුවත්පතක විකාශය වූ/ පළ වූ, දේශීය අන්තර්ගතයක් සහිත නිර්මාණ පමණි.

03. සම්මාන සඳහා ඉදිරිපත් කරන නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර හැකිතාක් එම නිර්මාණ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරන්නේ නම් මැනවි. එසේ නොවන අවස්ථාවලදී ස්වාධීනව වුවද තමන්ගේ නිර්මාණයක් බවට තමා විසින්ම දිවුරුම් ප්‍රකාශයක් මගින් සහතික කොට ඉදිරිපත් කළ හැකිය.

04. ඉදිරිපත් කරන නිර්මාණයෙහි භාෂාව, මාධ්‍ය ක්ෂේත්‍රය හා තරඟ අංශය අයදුම්පතෙහි වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. එක් අයදුම්කරුවෙකුට සම්මාන ක්ෂේත්‍ර එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර එක් සම්මානයකට අදාළව ඉදිරිපත් කළ හැක්කේ උපරිම වශයෙන් එක් නිර්මාණයකි.

06. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී අදාළ පුවත්පතෙහි, නාලිකාවෙහි, වෙබ් මාධ්‍ය ඔස්සේ පළවූ, විකාශය වූ නිර්මාණ ආයතන ප්‍රධානීන්ට හෝ කර්තෘවරුන්ට නිර්මාණයෙහි නිර්මාණකරු වෙනුවෙන් ඔහුගේ/ ඇයගේ එකඟත්වය මත ඉදිරිපත් කළ හැකිය.

07. (අ) පුවත්පත් මාධ්‍යයට අදාළ නිර්මාණ ඉදිරිපත් කිරීමේදී නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ මුල් නිර්මාණය හෝ මුල් නිර්මාණයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ගුවන්විදුලි මාධ්‍යයට අදාළ නිර්මාණ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ .mp3 ක්‍රමවේදය ඔස්සේ pen drive මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) රූපවාහිනී මාධ්‍යයට අදාළ නිර්මාණ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ .mov ක්‍රමවේදය ඔස්සේ pen drive මගින් ඉදිරිපත් කළ යුතුය. Data Format ලෙස ඉදිරිපත් කරන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) වෙබ් මාධ්‍යයට අදාළ නිර්මාණ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ සහතික කළ මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති මාර්ගගත අයදුම්පත්‍රයේ ඔබට අදාළ වන ස්ථානයේ Hyperlink සම්බන්ධතාව සඳහන් කිරීම අනිවාර්ය වේ.

(ඉ) මාධ්‍ය පර්යේෂණ ශාස්ත්‍රීය කෘතිය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මුද්‍රිත ග්‍රන්ථ පිටපතක් හා e-version (පවතින්නේ නම්) අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පළමු මුද්‍රණය සිදු කළ කෘතීන් පමණක් භාර ගනු ලැබේ.

(ඊ) පාසල් මාධ්‍ය ක්ෂේත්‍රය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ සිදුකරන ලද කාර්යයන් තහවුරු කිරීම සඳහා ලිපි/ ලේඛන හා ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

08. ඔබ විසින් අයදුම් කරන සෑම තරග අංශයක් සඳහාම අයදුම්පත්‍රය හා මුල් පිටපත් හෝ ඡායා පිටපත් ලියුම් කවරයක බහා ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ජනාධිපති මාධ්‍ය සම්මාන - 2024** හා තරග අංශය හා අංකය (විස්තර පත්‍රිකාවේ සඳහන් පරිදි) සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. තැපෑලෙන් යොමු කළ නොහැකි නිර්මාණ ගෙනැවිත් බාරදිය හැකිය. ඉහත (07) (අ) (ආ) (ඇ) (ඈ) (ඉ) (ඊ) ට අදාළ අයදුම්පත් බාරගනු ලබන්නේ සතියේ කාර්යාලයීය දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් වන අතර නිර්මාණ භාරගැනීම **2024.10.30 දින ප.ව. 4.00** ට අවසන් වේ.

09. අසම්පූර්ණ අයදුම්පත් සලකා බලනු නොලැබේ. විස්තර පත්‍රිකාව සහ අයදුම්පත්‍රය www.media.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

10. ජනාධිපති මාධ්‍ය සම්මාන 2024 විනිශ්චයන් සම්බන්ධයෙන් ජූරි සභාව විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**නිර්මාණ යොමු කළ යුතු ලිපිනය :**

අතිරේක ලේකම් (සංවර්ධන, සැලසුම් හා තොරතුරු)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා,
සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක.163, කිරුළපන මාවත
පොල්හේන්ගොඩ
කොළඹ 05.
වැඩිදුර විස්තර සඳහා 011-2513737 මගින් සංවර්ධන අංශය අමතන්න

ලේකම්,
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ජනාධිපති මාධ්‍ය සම්මාන - 2024
# අයදුම්පත්‍රය

❖ වෙබ් අඩවි ක්ෂේත්‍රය සඳහා අයදුම් කිරීමට www.media.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් අංකය - | | | | | | |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ නම සහ විස්තරය

(අ) සම්පූර්ණ නම : ……………………………………………………………..

……………………………………………………………………………………..

(ආ) ක්ෂේත්‍රයේ භාවිතා කරන නම : ……………………………………………………………..

(ඇ) සහතිකයේ සඳහන් කළ යුතු නම : ……………………………………………………………..
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ඇ) ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර / රියදුරු බලපත්‍ර අංකය : ……………………………..

(ඉ) 2023.12.31 දිනට වයස : ……………………………………………………………..

02. පෞද්ගලික ලිපිනය : ……………………………………………………………..

03. විද්‍යුත් තැපැල් ලිපිනය : ……………………………… ………………………………..

04. දුරකථන අංක :නිවස :.................. ජංගම :.................. WhatsApp : .................

05. සේවා විස්තරය

(අ) සේවා ආයතනයේ නම : ……………………………………………………………..

(ආ) සේවා ආයතනයේ ලිපිනය : ……………………………………………………………..

(ඇ) දුරකථන අංකය : ……………………………………………………………..

06. (අ) අයදුම්කරනු ලබන ක්ෂේත්‍රය :

| | | | |
|---|---|---|---|
| පුවත්පත් | | ගුවන්විදුලි | |
| රූපවාහිනී | | වෙබ් අඩවි | |
| මාධ්‍ය පර්යේෂණ | | | |

(ආ) අයදුම්කරනු ලබන භාෂාව :

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | |

(කරුණාකර අදාළ භාෂාව සඳහා (√ ) ලකුණ යොදන්න)

(ඇ) අයදුම්කරනු ලබන තරග අංශය හා අනු අංකය : ……………………………………………………......

07. (අ) නිර්මාණයේ නම :…………………………………………………..

(ආ) නිර්මාණයේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : …………………………………………….....

(ඇ) නිර්මාණය පළ වූ පුවත්පත/ විකාශය වූ නාලිකාවේ නම / නිර්මාණය පළවූ වෙබ් අඩවිය

: …………………………………………………………………………………………….

08. නිර්මාණය පළ වූ / විකාශය වූ :

| වසර | මාසය | දිනය | වේලාව | කාලසීමාව |
|---|---|---|---|---|
| 2023 | | | | |

09. ඒක පුද්ගල නිර්මාණයක් ද / සාමූහික නිර්මාණයක් ද යන වග : .........................................................

(සාමූහික නිර්මාණයක් නම් පමණක් අදාළ පාර්ශව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය)

ජනාධිපති මාධ්‍ය සම්මාන 2024 සම්බන්ධ ප්‍රකාශිත කොන්දේසිවලට එකඟ වන අතර එහි විනිශ්චයන් සම්බන්ධයෙන් ජූරි සභාව විසින් ගන්නා තීරණය, අවසාන තීරණය වශයෙන් පිළිගනිමි/ ගනිමු. මා/ අප විසින් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද විනිශ්චය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණය මාගේ/ අපගේ/ අප ආයතනයේ නිර්මාණයක් බව ද එහි හිමිකම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වුවහොත්, එය නිරවුල් කරදීමේ වගකීම මා/ අප සතු වන බවත් මෙයින් සහතික කරමි/ කරමු.

| දිනය | අයදුම්කරු/ කරුවන්ගේ නම | අයදුම්කරු/ කරුවන්ගේ අත්සන |
|---|---|---|
| | | |

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

........................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය (මාධ්‍යවේදියාගේ නම) මේ සමඟ ඉදිරිපත් කරන ..........................................................................................(නිර්මාණයේ නම)..................(දිනය/ වේලාව - මෙය විද්‍යුත් මාධ්‍ය අයදුම්කරුවන් සඳහා පමණි.) පළවූ/ විකාශය වූ නිර්මාණයක් බවත් එය ඔහුගේ/ ඇයගේ/ අප ආයතනයේ නිර්මාණයක් බවත් මෙයින් සහතික කරමි.

දිනය :....................

ආයතන ප්‍රධානියාගේ අත්සන :............................................

නිල මුද්‍රාව : ..........................................